# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2146/31 - 2019 ඔක්තෝබර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වැනි වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2016 ජූලි මස 04 දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, 2017 දෙසැම්බර් මස 15 දින අංක 2049/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, සහ 2018 මාර්තු මස 16 දින අංක 2062/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද පශ්චාත් නියම මගින් සංශෝධිත 2012 දෙසැම්බර් මස 19 දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන වගන්තිය යටතේ පළ කරනු ලැබූ නියමයට තවදුරටත් වූ වශයෙන්, මෙම නියමය මගින් -

2016 ජූලි මස 04 දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, 2017 දෙසැම්බර් මස 15 දින අංක 2049/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2018 මාර්තු මස 16 දින අංක 2062/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද පශ්චාත් නියම මගින් සංශෝධිත 2012 දෙසැම්බර් මස 19 දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

එනම් -

''(4) බස්නාහිර පළාතේ අංක 116, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි සේවා මහල් නිවාස 90 කින් යුත් කාමර 475 ක් සහිත නගර හෝටලයක් ඉදිකර පවත්වාගෙන යෑම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය'' විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘති ගිවිසුම අත්සන් කිරීමේ දිනය වන 2012 ජූලි මස 19 දින සිට ආරම්භව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස එකසිය විසිපහක (125) කාලසීමාවක් ඇතුළත ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු අතර ඉදිකිරීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන අතිරේක ආයෝජනය පිළිබිඹු කිරීම සඳහා 2012 අගෝස්තු මස 15 දින අංක 1771/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ සඳහන් එක්සත් ජනපද ඩොලර් මිලියන එකසිය පනස් අටයි අටලක්ෂ අනූ දහසක්වූ (එ. ජ. ඩො. 158,890,000) අවම ආයෝජනය එක්සත් ජනපද ඩොලර් මිලියන දෙසිය පනහක් (එ. ජ. ඩො. 250,000,000) දක්වා වැඩි කරනු ලැබිය යුතු වේ.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

11 - 782

1A - PG 4718 — 392 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*